සියලු ම හිමිකම් ඇවිරිණි

## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අන්තර්මධ්‍ය විභාගය - 2012 ජනවාරි

## (54) ගිණුම්කරණය හා පාලන පද්ධති

Accounting & Control Systems

2012.01.28
පෙරවරු
[9.00 – 12.00]

**කාලය: පැය 03 යි.**

- **අයදුම්කරුවන්ට උපදෙස්:**

පිටු ගණන: 08
ප්‍රශ්න ගණන: 06

*(1) මෙම පත්‍රය **A, B** සහ **C** යන කොටස් තුනකින් (03) යුක්ත වේ.*

*(2) **පහත දැක්වෙන පරිදි, ප්‍රශ්න පහකට (05) උත්තර ලිවිය යුතු ය.***

- ***A කොටසේ අංක 01 දරණ ප්‍රශ්නයට;***
- ***B කොටසේ ප්‍රශ්න දෙකටම (02);***
- ***C කොටසෙන් ඕනෑම ප්‍රශ්න දෙකකට (02).***

*(3) ඉල්ලුම් කරන ලද **මාධ්‍යයට** අදාලව, එක් **භාෂාවකින්** පමණක්, ඔබ වෙත සපයනු ලබන **පොත්වල** උත්තර ලියන්න.*

*(4) **පෙරවැඩ** සහ ගණනය කිරීම් සියල්ල ඉදිරිපත් කරන්න. ඔබ විසින් කරනු ලබන **උපකල්පන** කිසිවක් වේ නම්, ඒවා පැහැදිලිව සඳහන් කරන්න.*

*(5) ගණක යන්ත්‍ර භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

*(6) ලකුණු 100.*

---

### A - කොටස

බහුවරණ ප්‍රශ්න

මෙම කොටසේ සියලු ම ප්‍රශ්න වලට උත්තර ලියන්න.

ලකුණු 30.

**01.** පහත සඳහන් එක් එක් කොටසට **වඩාත්ම නිවැරදි** උත්තරය (1), (2), (3), (4) අතුරෙන් තෝරන්න. එසේ තෝරාගත් උත්තරයට අදාල ඉලක්කම, ප්‍රශ්නයට යොදා ඇති ඉංග්‍රීසි අක්ෂරය සමඟ පිළිතුරු පොතේ ලියන්න.

(A) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වූ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආකෘතිමය රාමුව අනුව බලපවත්වන උපකල්පන දෙක තෝරන්න:

(1) අස්තිත්ව සංකල්පය (Entity Concept) සහ උපචිත පදනම (Accrual Basis).
(2) උපචිත පදනම සහ ඓතිහාසික පිරිවැය සංකල්පය (Historical Cost Concept).
(3) අඛණ්ඩ පැවැත්ම සහ ආකෘතියට වඩා හරය වැදගත්වීම (Substance over Form).
(4) උපචිත පදනම සහ අඛණ්ඩ පැවැත්ම.

(B) ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිත නිකුත් කිරීම සඳහා අධිකාරිය ඇත්තේ පහත සඳහන් ඒවායින් කවර එකකටද?

(1) ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයට.
(2) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට.
(3) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත කමිටුවට.
(4) සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට.

(C) **සීමාසහිත ABC සමාගමේ** 2011 මාර්තු 31 දිනට අවසන් තොගය රු.950,000/- ක පිරිවැයකට අගය කර ඇත. එම තොගයේ පිරිවැය රු.40,000/- ක් වූ පළුදු වූ තොග අයිතම් අඩංගු වේ. පළුදු වූ තොග අළුත්වැඩියා කිරීම සඳහා රු.6,000/- ක වියදමක් දැරීමෙන් පසු රු.25,000/- කට විකිණිය හැකිවේ යැයි ඇස්තමේන්තු කර ඇත. ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසු **සීමාසහිත ABC සමාගමේ** 2011 මාර්තු 31 දිනට ශේෂ පත්‍රයේ පිළිඹිබු විය යුතු තොග ශේෂය වන්නේ:

(1) රු. 910,000/-.
(2) රු. 929,000/-.
(3) රු. 935,000/-.
(4) ඉහත සඳහන් කිසිවක් නොවේ.

(D) ව්‍යාපාර ආයතනයක ගැනුම් ජර්නලයේ / දෛනික පොතේ සටහන් කරනු ලබන්නේ පහත සඳහන් ගනුදෙනු වලින්:

(1) නැවත විකිණීමේ අදහසින් කරන ලද සියළුම මුදලට ගැනුම්ය.

(2) නැවත විකිණීමේ අදහසින් කරන ලද සියළුම ණයට ගැනුම්ය.

(3) සියළුම ණයට ගැනුම්ය.

(4) නැවත විකිණීමේ අදහසින් කරන ලද සියළුම ගැනුම්ය.

(E) ගැනුම්කරුට අඩුවෙන් බාර දී ඇති භාණ්ඩ ප්‍රමාණය වෙනුවෙන් ඔහුගෙන් ලැබෙන හර පත්‍රයක් (Debit Note) විකුණුම්කරුගේ ගිණුම් පොත්වල සටහන් කරනු ලබන්නේ:

(1) ආපසු එවුම් ගිණුම හර කර ණයගැතියාගේ ගිණුම බැර කිරීමෙනි.

(2) ණයහිමියාගේ ගිණුම හර කර ආපසු යැවුම් ගිණුම බැර කිරීමෙනි.

(3) විකුණුම් ගිණුම හර කර ආපසු යැවුම් ගිණුම බැර කිරීමෙනි.

(4) ඉහත සඳහන් කිසිවකින් නොවේ.

(F) 2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ණයගැති පාලන ගිණුමට සම්බන්ධ පහත සඳහන් තොරතුරු ඔබට දී ඇත.

| | රු. |
|---|---|
| 2010 අප්‍රේල් 01 දිනට ශේෂය (හර) | 791,200 |
| ණයට විකුණුම් | 5,000,000 |
| වර්ෂය තුල ණයගැතියන්ගෙන් ලැබීම් | 3,800,000 |
| 2011 මාර්තු 31 දිනට ශේෂය (හර) | 1,421,200 |
| ආපසු එවූ විකුණුම් | 220,000 |
| ණය හිමියන්ට කරන ලද ගෙවීම් වැරදීමකින් ණයගැති පාලන ගිණුමේ සටහන් කිරීම | 200,000 |

ඉහත දත්ත අනුව වර්ෂය තුල ලියා හරින ලද බොල්ණය ප්‍රමාණය වන්නේ:

(1) රු.150,000/-. (2) රු.550,000/-. (3) රු.150,200/-. (4) රු. 570,000/-.

(G) පහත දී ඇති තොරතුරු **සීමාසහිත රේ ෂෝ (පෞද්.) සමාගමේ** පොත් වලින් 2011 දෙසැම්බර් මාසය සඳහා උපුටා ගන්නා ලදී.

| | රු. | | රු. |
|---|---|---|---|
| මූලික වැටුප | 650,000 | ණය වාරික | 52,000 |
| ස්ථාවර දීමනා | 175,000 | උපයන විට ගෙවීමේ බදු | 7,500 |
| අතිකාල | 225,000 | සේවක අර්ථසාධක අරමුදල (EPF) 8% | 66,000 |
| | | සේවක අර්ථසාධක අරමුදල 12% | 99,000 |
| | | සේවා නියුක්තියන්ගේ භාර අරමුදල (ETF) 3% | 24,750 |
| | **1,050,000** | | **249,250** |

ඉහත සඳහන් තොරතුරු පදනම් කරගත්විට, මාසය සඳහා සේවකයන්ට ගෙවිය යුතු ශුද්ධ වැටුප වන්නේ:

(1) රු. 800,750/-. (2) රු. 924,500/-. (3) රු. 825,500/-. (4) රු.249,250/-.

(H) ව්‍යාපාර ආයතනයක කෙටිකාලීන ද්‍රවශීලත්වය මැනීම සඳහා වඩාත්ම යෝග්‍ය අනුපාත කට්ටලය වන්නේ:

(1) ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය සහ වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය.

(2) දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය.

(3) ජංගම අනුපාතය සහ දළ ලාභ අනුපාතය.

(4) ජංගම අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතය.

(I) **A සමාගමේ** මාසයක් අවසානයේ දී බැංකු ප්‍රකාශය අනුව රු.230,000/- ක ශේෂයක් පෙන්නුම් කරන අතර එදිනට මුදල් පොත අනුව ශේෂය රු.130,000/- (හර) ක් විය. කෙසේවෙතත් **A සමාගමේ** බැංකු ප්‍රකාශය පරීක්ෂා කර බැලීමේදී බැංකුව මාසය සඳහා ආයෝජන පොලී වශයෙන් රු.90,000/- ක් බැර කර ඇති බව සොයා ගැනුණි. බැංකුව විසින් වැරදීමකින් කළ රු.12,500/- ක බැර කිරීමක් සහ බැංකුව විසින් හර කරන ලද රු.2,500/- ක බැංකු ගාස්තු බැංකු ප්‍රකාශයේ ඇතුලත්ව තිබුණි. මාසය අවසානයේදී **A සමාගමේ** ගලපන ලද මුදල් පොතේ ශේෂය විය යුත්තේ:

(1) හර රු.220,000/-.
(2) හර රු.217,500/-.
(3) හර රු.127,500/-.
(4) හර රු.115,000/-.

(J) ණය හිමියන්ට ගෙවීම් කළ විට ව්‍යාපාර ඒකකයක (අස්තිත්වයක) කාරක ප්‍රාග්ධනය:

(1) වැඩි වේ.
(2) අඩු වේ.
(3) වෙනසක් නොවේ.
(4) ඉහත සඳහන් කිසිවක් නොවේ.

(K) පහත සඳහන් ඒවායින් අභ්‍යන්තර පාලනයේ අරමුණක් **නොවන්නේ**:

(1) වත්කම් ආරක්ෂා කිරීම.
(2) කළමනාකරණ තීරණ වලට අනුකූලව ක්‍රියා කිරීම.
(3) වර්ෂය සඳහා ලාභය වැඩි කිරීම.
(4) වංචා හා වැරදි වැළැක්වීම හා අනාවරණය කර ගැනීම.

(L) අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් පිළිගත **නොහැකි** ප්‍රකාශය තෝරන්න:

(1) සමාගමක කොටස් හිමියන් විසින් අභ්‍යන්තර විගණක පත් කරනු ලැබේ.
(2) අභ්‍යන්තර විගණකයකු සඳහා සුදුසුකම් කිසිවක් 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියම කර නැත.
(3) අභ්‍යන්තර විගණනය අඛණ්ඩව සිදු කරන ආකාරයේ විගණනයකි.
(4) අභ්‍යන්තර විගණක ඔහුගේ වාර්තාව සමාගමේ කොටස් හිමියන්ට ඉදිරිපත් කිරීම අවශ්‍ය නැත.

(M) බැංකු ශේෂ සත්‍යාපනය කිරීමේදී වඩාත්ම විශ්වාසදායී වන්නේ:

(1) කළමනාකරණ නියෝජනය.
(2) බැංකු වලින් ලබා ගන්නා ඍජු සනාථ කිරීම්.
(3) බැංකුවේ තැන්පත් කිරීම පරීක්ෂා කිරීම.
(4) ගිණුම් පොත්වල ඇති බැංකු ගිණුම් එකතු කිරීම.

(N) ව්‍යවස්ථාපිත විගණකගේ මූලික (ප්‍රාථමික) රාජකාරිය වන්නේ:

(1) වැරදි හා වංචා අනාවරණය කර ගැනීමය.
(2) ගිණුම් පිළියෙල කිරීමය.
(3) මූල්‍ය ප්‍රකාශ මත ස්වාධීන මතයක් ප්‍රකාශ කිරීමය.
(4) කළමනාකරණ තොරතුරු සැපයීම.

(O) පහත සඳහන් ඒවායින්, අභ්‍යන්තර විගණනයක අත්‍යවශ්‍ය අංගයක් **නොවන්නේ:**

(1) සාධාරණ සැලකිල්ල ය.
(2) මාණ්ඩලිකරණය ය.
(3) ගණකාධිකරණ උපාධිධාරියෙකු වීම ය.
(4) පුහුණුව ය.

(එකකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 30)

## B - කොටස

අනිවාර්ය ප්‍රශ්න

මෙම කොටසේ ප්‍රශ්න දෙකටම (02) උත්තර ලියන්න.

ලකුණු 50.

**02.** පහත සඳහන් ශේෂ පිරික්සුම **සීමාසහිත ටෙක්නෝ ෆස්ට් (පෞද්.) සමාගමේ** පොත්වලින් 2011 මාර්තු 31 දිනට උපුටා ගන්නා ලදී.

**2011 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම**

| | **හර රු.'000** | **බැර රු.'000** |
|---|---|---|
| ප්‍රකාශ කළ ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් 600,000 | | 72,000 |
| පොදු සංචිතය | | 6,000 |
| 2010 අප්‍රේල් 01 දිනට රඳවා ගත් ඉපැයීම් | | 3,200 |
| **දේපල, පිරියත හා උපකරණ පිරිවැයට** | | |
| ඉඩම් හා ගොඩනැගිලි (ඉඩමේ අගය රු. මිලියන 25) | 75,000 | |
| කාර්යාල උපකරණ | 12,200 | |
| ලී බඩු හා සවිකිරීම් | 8,800 | |
| මෝටර් වාහන | 24,200 | |
| **2010 අප්‍රේල් 01 දිනට ක්ෂය සඳහා ප්‍රතිපාදනය** | | |
| ගොඩනැගිලි | | 20,500 |
| කාර්යාල උපකරණ | | 4,880 |
| ලී බඩු හා සවි කිරීම් | | 3,520 |
| මෝටර් වාහන | | 7,800 |
| 2011 මාර්තු 31 දිනට තොග | 7,400 | |
| විකුණුම් පිරිවැය / පිරිවැටුම (විකුණුම්) | 34,000 | 64,000 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 8,800 | 7,300 |
| 2010 අප්‍රේල් 01 දිනට අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය | | 370 |
| අතැති හා බැංකුවේ මුදල | 520 | |
| ස්ථාවර තැන්පත් | 6,750 | |
| ගෙවූ ආදායම් බදු | 2,100 | |
| පරිපාලන වියදම් | 3,900 | |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | 3,500 | |
| මූල්‍ය වියදම් | 2,100 | |
| 12% බැංකු ණය මුදල | | 1,800 |
| ගෙවූ අතුරු ලාභාංශ | 3,000 | |
| ලැබූ පොලිය | | 900 |
| **එකතුව** | **192,270** | **192,270** |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත:

(1) 2011 මාර්තු 31 දිනට අවසාන තොගයේ අගය ගණනය කිරීමේදී රු.55,000/- ක් පිරිවැය වූ ඉක්මනින් නිකුත්වන තොග අඩංගු තොග පත්‍රිකාවක අගය අතපසු වීමකින් ගිණුම්ගත කර නැත.

(2) 2010 අප්‍රේල් 01 දින රු.3,000,000/- ක් වටිනා අළුත් වාහනයක් 'X' ගෙන් මිලදී ගැනීමේදී ගැනුම් මිලේ කොටසකට හුවමාරුවක් ලෙස පිරිවැය රු.1,200,000/- ක් වූ මෝටර් වාහනයක් 'X' ට පවරන ලදී. හුවමාරුව සිදුවූ දිනට පැවරූ මෝටර් වාහනයේ සමුච්චිත ක්ෂය වීම රු.500,000/- කි.

මෙම ගනුදෙනුවේ එකඟ වූ ඉතිරි මුදල වන රු.2,200,000/- මුදලින් ගෙවන ලද අතර එය මෝටර් වාහන ගිණුමට හර කරන ලදී. මේ සම්බන්ධයෙන් වෙනත් සටහන් කිසිවක් තබා නැත.

(3) වත්කම් සරල මාර්ග පදනම අනුව පිරිවැය මත පහත සඳහන් අනුපාතික අනුව ක්ෂය කල යුතුය:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි වර්ෂයකට | 5% | බැගින් |
| කාර්යාල උපකරණ වර්ෂයකට | 20% | බැගින් |
| ලී බඩු හා සවි කිරීම් වර්ෂයකට | 20% | බැගින් |
| මෝටර් වාහන වර්ෂයකට | 25% | බැගින් |

(4) බැංකු ණය මුදල 2011 මාර්තු 01 දින ලබා ගත් අතර මුල් මුදල සමාන මාසික වාරික 12 කින් සහ ඊට අදාල පොලිය සමග ආපසු ගෙවිය යුතුය. කලින් මාසය සඳහා හිගව පැවති ශේෂය මත පොලිය සහ මුල් මුදලේ කොටස 2011 අප්‍රේල් 01 දින සිට සෑම මසකම පළමුවන දිනයේදී ගෙවිය යුතුය.

(5) **මාලන්** ගෙන් ලැබිය යුතු රු.40,000/- ක මුදල අයකරගත නොහැකි බැවින් එය ලියා හැරීමට තීරණය කරන ලදී. 2011 මාර්තු 31 දිනට ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් මත 5% පොදු ප්‍රතිපාදනයක් සැලසිය යුතුය.

(6) 2011 මාර්තු 31 දිනට උපචිත වියදම් සහ කලින් ගෙවීම් පහත සඳහන් පරිදි වේ:

| | **රු.** | |
|---|---|---|
| | **උපචිත වියදම්** | **කලින් ගෙවීම්** |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | - | 102,000 |
| පරිපාලන වියදම් | 261,000 | - |

(7) වර්ෂය සඳහා ගෙවිය යුතු බද්ද රු.2,200,000/- ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

(8) 2011 අප්‍රේල් 02 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී රු.1,000,000/- ක් පොදු සංචිතයට මාරු කිරීමට තීරණය කර ගන්නා ලදී.

**ඔබ විසින්, සීමාසහිත ටෙක්නෝ ෆස්ට් (පෞද්.) සමාගමේ** කළමනාකරිත්වයේ ප්‍රයෝජනය සඳහා පහත සඳහන් දෑ පිළියෙල කල යුතුය:

(a) 2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය. (ලකුණු 15)

(b) 2011 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ශේෂ පත්‍රය). (ලකුණු 10)

(මුළු ලකුණු 25)

**03.** (A) හවුල් ව්‍යාපාරයක කීර්ති නාමය අගය කිරීමට අවශ්‍ය කෙරෙන අවස්ථා හතරක්(04) ලැයිස්තුගත කරන්න. (ලකුණු 02)

(B) **හිරු** සහ **සඳු** ලාභ හා අලාභ පිළිවෙලින් 3 : 2 අනුපාතයට බෙදා ගන්නා **විජුවල් පාට්නස්** හි, හවුල්කරුවෝ වෙති.

2010 ජූලි 01 දින සිට හවුල් ව්‍යාපාරයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු වන **තරු,** පහත සඳහන් කොන්දේසි මත නව හවුල්කරුවෙකු ලෙස හවුල් ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී:

(1) හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමයේ මුළු වටිනාකම රු.18,000,000/- කට අගය කරන ලද අතර කීර්තිනාමය ගිණුම් පොත්වල නොපෙන්වා අවශ්‍ය ගැලපීම් ප්‍රාග්ධන ගිණුම් මාර්ගයෙන් ගිණුම්ගත කිරීමට ඔවුහු එකඟ වූහ.

(2) **තරු** විසින් ඔහුගේ ප්‍රාග්ධනය සහ කීර්තිනාමයේ කොටස වශයෙන් රු.11,000,000/- ක් හවුල් ව්‍යාපාරයට ගෙන ආ යුතු විය.

(3) නව හවුල් ගිවිසුම අනුව හවුල්කරුවන්ට පහත සඳහන් පරිදි මාසික වැටුප් වලට හිමිකම ඇත.

| | | |
|---|---|---|
| **හිරු** | : | රු. 50,000/- |
| **සඳු** | : | රු. 40,000/- |
| **තරු** | : | රු. 30,000/- |

(4) **හිරු, සඳු** හා **තරු** යන හවුල්කරුවන් අතර ලාභ සහ අලාභ පිළිවෙලින් 3 : 2 : 1 අනුපාතයට බෙදා ගත යුතුය.

2011 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත සඳහන් පරිදි විය:

**2011 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | **හර** | **බැර** |
|---|---|---|
| 2010 අප්‍රෙල් 01 දිනට තොග | 2,550 | |
| ගැනුම් | 19,280 | |
| විකුණුම් (රු.10,000,000/- ක විකුණුම් පළමු තුන් මාසයට අදාලය) | | 50,000 |
| හවුල්කරුවන්ගේ වැටුප් ඇතුළුව පරිපාලන වියදම් | 14,628 | |
| වෙළෙඳ ප්‍රදර්ශනාගාර කුලිය | 1,980 | |
| විකුණුම් වියදම් | 2,425 | |
| අයිරා පොලිය | 600 | |
| ආයෝජන ආදායම් | | 240 |
| **ප්‍රාග්ධන ගිණුම්:** | | |
| **- හිරු** | | 18,000 |
| **- සඳු** | | 14,800 |
| **- තරු** | | 11,000 |
| **ජංගම ගිණුම්:** | | |
| **- හිරු** | | 5 |
| **- සඳු** | | 400 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 8,560 | 3,650 |
| බැංකු අයිරාව | | 2,611 |
| **දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට:** | | |
| ඉඩම් හා ගොඩනැගිලි (ඉඩමේ පිරිවැය රු. මිලියන 25) | 35,000 | |
| කාර්යාල උපකරණ | 10,000 | |
| මෝටර් වාහන | 10,800 | |
| **සමුච්චිත ක්ෂය වීම** (2010 අප්‍රේල් 01 දිනට): | | |
| ගොඩනැගිලි | | 1,600 |
| කාර්යාල උපකරණ | | 2,400 |
| මෝටර් වාහන | | 3,400 |
| ආයෝජන | 2,420 | |
| 2010 අප්‍රේල් 01 දිනට අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය | | 363 |
| අතැති හා බැංකුවේ මුදල් | 226 | |
| | **108,469** | **108,469** |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත:

(1) දේපල, පිරියත හා උපකරණ ක්ෂයවීම් සඳහා සරල මාර්ග ක්‍රමය මත පිරිවැයට පහත සඳහන් පරිදි ප්‍රතිපාදනය කළ යුතුය:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි වර්ෂයකට | 5% | බැගින් |
| කාර්යාල උපකරණ වර්ෂයකට | 10% | බැගින් |
| මෝටර් වාහන වර්ෂයකට | 25% | බැගින් |

(2) වෙළෙඳ ප්‍රදර්ශනාගාරය සඳහා මාසික කුලිය රු.180,000/- ක් වන අතර ගෙවල් කුලී ගිවිසුම 2008 ජනවාරි 01 වන දින ආරම්භ වන අතර වර්ෂ 5 ක කාල පරිච්ඡේදයක් සඳහා ක්‍රියාත්මක වේ.

(3) 2011 මාර්තු 31 දිනට ලැබිය යුතු රු.460,000/- ක මුදලක් බොල් ණය ලෙස ලියා හැරිය යුතු අතර ඉතිරි ශේෂයෙන් 5% ක් වන සේ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනයක් කළ යුතුය.

(4) පහතින් සඳහන් කර ඇති වියදම් හැර සියලුම ආදායම් හා වියදම් කාලය පදනම් කර ගෙන බෙදා හැරිය යුතුය:

| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | විකුණුම් පදනම |
|---|---|
| ලියා හැරි බොල්ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය | නව හවුල් ව්‍යාපාරය ක්‍රියාත්මක වූ කාල පරිච්ඡේදයට අදාල වේ. |

(5) 2011 මාර්තු 31 දිනට තොගය රු.3,830,000/- කි.

(6) හවුල්කරුවන්ගේ වැටුප් සෑම මාසයකම වැඩකරන අවසාන දිනයේදී මුදලින් ගෙවා ඇත.

**ඔබ විසින්, විජුවල් පාට්නර්ස්** සඳහා පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුය:

(a) තිරු ක්‍රමයට 2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළෙඳ, ලාභ'ලාභ ගිණුම සහ විසර්ජන ගිණුම. (ලකුණු 11)

(b) 2011 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පත්‍රය. (ලකුණු 05)

(c) තිරු ක්‍රමයට 2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම්. (ලකුණු 07)

(මුළු ලකුණු 25)

## C - කොටස

මෙම කොටසේ ඕනෑම ප්‍රශ්න දෙකකට (02) පමණක් උත්තර ලියන්න.
ලකුණු 20.

**04.** (A) පහත සඳහන් තොරතුරු **සීමාසහිත වැට්කෝ (පෞද්.) සමාගමේ** 2011 මාර්තු මාසය සඳහා වූ පොත් වලින් උපුටා ගන්නා ලදී.

| | **රු.** |
|---|---|
| එකතු කළ අගය මත බදු (VAT) පාලන ගිණුමේ ආරම්භක බැර ශේෂය | 92,000 |
| දේශීය විකුණුම්: | |
| ණයට විකුණුම් (එකතු කළ අගය මත බදු ඇතුළත්ව) | 3,472,000 |
| මුදලට විකුණුම් (එකතු කළ අගය මත බදු නොමැතිව) | 1,000,000 |
| ආනයනය කළ අමුද්‍රව්‍ය පිරිවැය (එකතු කළ අගය මත බදු රු.108,000/- ක් ඇතුළත්ව) | 1,008,000 |
| දේශීය මිලදී ගැනුම් (එකතු කළ අගය මත බදු ඇතුළත් පිරිවැය) | 3,696,000 |

(එකතු කළ අගය මත බදු අනුපාතය [VAT] 12% කි)

**ඔබ විසින්,** 2011 මාර්තු මාසය සඳහා එකතු කළ අගය මත බදු පාලන ගිණුම පිළියෙල කළ යුතුය. (ලකුණු 05)

(B) පහත සඳහන් තොරතුරු **සීමාසහිත රේ ෂෝ (පෞද්.) සමාගමේ** 2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ ගිණුම් පොත් වලින් උපුටා ගන්නා ලදි:

| | **රු.'000** |
|---|---:|
| වර්ෂයේ ණයට විකුණුම් | 12,045 |
| වර්ෂයේ අත්පිට විකුණුම් | 2,500 |
| වර්ෂය ආරම්භයේ ණයගැතියෝ | 1,100 |
| වර්ෂය අවසානයේ ණයගැතියෝ | 1,540 |
| වර්ෂයේ විකුණුම් පිරිවැය | 8,030 |
| වර්ෂය ආරම්භයේ තොග | 816 |
| වර්ෂය අවසානයේ තොග | 790 |
| වර්ෂයේ සාමාන්‍ය ණයහිමියෝ | 1,540 |
| වර්ෂය අවසානයේදී ජංගම වත්කම් | 5,250 |
| වර්ෂය අවසානයේදී ජංගම වගකීම් | 3,568 |

(වර්ෂයකට දින ගණන = 365)

**ඔබ විසින්,** 2011 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා,

(a) ණයගැති එකතු කිරීමේ කාලය (debt collection period).

(b) ණය හිමි පියවීමේ කාලය (creditors settlement period).

(c) තොග පිරිවැටුම් අනුපාතය (inventory turnover ratio).

(d) ජංගම වත්කම් අනුපාතය (current asset ratio).

(e) ක්ෂණික වත්කම් අනුපාතය (quick asset ratio).

ගණනය කළ යුතුය. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

**05.** (A) පහත සඳහන් අභ්‍යන්තර පාලන පද්ධතියක ඇති සංරචක කෙටියෙන් පැහැදිලි කරන්න.

(a) ගිණුම්කරණ පද්ධතිය (Accounting System).

(b) සමීක්ෂණය (Monitoring). (ලකුණු 04)

(B) මිලදී ගැනුම් සහ වෙළෙඳ ගෙවිය යුතු ගිණුම් සඳහා අදාල වන අභ්‍යන්තර පාලන මිනුම් හයක්(06) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

**06.** (A) බාහිර විගණකයන් හා අභ්‍යන්තර විගණකයන් අතර අදහස් හුවමාරු කර ගැනීමේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(B) පහත සඳහන් අභ්‍යන්තර පාලන වර්ග කෙටියෙන් පැහැදිලි කරන්න:

(a) අධිකාරීත්වය සහ අනුමැතිය.

(b) කාර්යයන් බෙදීම. (ලකුණු 04)

(C) අභ්‍යන්තර පාලනයේ සීමාවන් තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

- o0o -